## මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරියගේ ශ්‍රී ලංකා සංචාරය නිමවීමෙන් පසු කරනු ලබන පුවත්පත් නිවේදනය

2007 ඔක්තෝබර් 13, කොළඹ.

ශ්‍රී ලංකාවට පැමිණෙන ලෙස මට ආරාධනා කිරීම ගැන අතිගරු ජනාධිපතිතුමාට ද, මගේ වැඩ සටහන සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම ගැන ශ්‍රී ලංකා ආණ්ඩුවට ද මගේ ස්තූතිය පිරිනමනු කැමැත්තෙමි. සිය අදහස් මා සමඟ බෙදා හදා ගැනීමට කාලය වැය කිරීම සම්බන්ධයෙන් සමරසිංහ අමාත්‍යතුමාට සහ රජයේ නිලධාරීන් බොහෝ දෙනාටත්, දේශපාලන පක්ෂ නියෝජිතවරුන්ටත්, ආගමික නායකයන්ටත්, සිවිල් සමාජ සාමාජිකයන්ටත් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හිතවත් නිලධාරී මහත්ම මහත්මීන්ටත්, මම ස්තූතිවන්ත වෙමි. තමන්ගේ ම අත්දැකීම් පිළිබඳ සාක්ෂි සහිතව මා මුණගැසීමට පැමිණි බොහෝ අයට ද මම විශේෂයෙන් ම මගේ කෘතඥතාව පළ කරමි.

ඊයේ මම යාපනයට ගියෙමි. මගේ ගමනට අවශ්‍ය පහසුකම් සලසාදීම සම්බන්ධයෙන් මිලිටරි බලධාරීන්ට මා කෘතඥ වන අතර මා බෙහෙවින් අගය කරන උණුසුම් පිළිගැනීමක් හා ආගන්තුක සත්කාර මට ලබාදීම සම්බන්ධයෙන් රදගුරුතුමාට මගේ විශේෂ ස්තූතිය පිරිනමනු කැමැත්තෙමි.

නැගෙනහිර ප්‍රදේශයේ සංචාරය කිරීමට කාලයක් නොතිබීම ගැන මම කනගාටු වෙමි. කිලිනොච්චියට යෑමට අවස්ථාවක් නොලැබීම සම්බන්ධයෙන් ද මම කනගාටු වෙමි. එසේ යෑමට අවස්ථාවක් ලැබුණේ නම් ළමා සොල්දාදුවන් බඳවා ගැනීම, වැඩිහිටියන් බලෙන් බඳවා ගැනීම සහ පැහැර ගෙන යෑම සහ දේශපාලන ඝාතන ඇතුළු මානව අයිතිවාසිකම් හා මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් මගේ දැඩි කනස්සල්ල එල්.ටී.ටී.ඊ. සංවිධානයට කෙළින් ම ප්‍රකාශ කිරීමට මම කැමැත්තෙන් සිටියෙමි. TMVP පක්ෂය සහ අනෙකුත් සන්නද්ධ කණ්ඩායම් සිදු කරන බරපතළ උල්ලංඝනය කිරීම් පිළිබඳව මට ලැබී ඇති විවිධ වාර්තාවලින් ද මම බෙහෙවින් ම කනස්සල්ලට පත්ව සිටිමි.

ගැටුමට සම්බන්ධ කරුණු කෙරෙහි ක්ෂණික අවධානය යොමුවීම හේතුවෙන් දිවයිනේ සියලු ප්‍රජාවන් කෙරෙහි බලපාන වඩා පුළුල් මානව අයිතිවාසිකම් පිළිබඳ කරුණු යටපත් වී තිබීම පිළිබඳ කරුණ ද මගේ සාකච්ඡාවලදී මට තදින් ම දැනී තිබේ. වෙනස් ආකාරයේ සැලකීම සහ බැහැරලීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අසමානතා, රාජ්‍ය පාලන හා දේශපාලන ජීවිතයේදී කාන්තා සහභාගිත්වය අඩුවීම, සංක්‍රමණික කම්කරුවන්ගේ අයිතිවාසිකම් සහ පුවත්පත් නිදහස යන කරුණු පිළිබඳ ගැටලු මේවාට ඇතුළත් වේ. කවර හෝ සාම විසඳුමකට පෙර හා පසුව වුවද මේ අභියෝග එසේ ම පවතිනු ඇති අතර ඒවා කෙරෙහි වැඩි වැඩියෙන් හා වඩා ගැඹුරින් අවධානය යොමු කිරීම අවශ්‍යය.

ශක්තිමත් ජාතික ආරක්ෂක පද්ධතියකට අවශ්‍ය මූලික අංග රාශියක් ශ්‍රී ලංකාව සතු වේ. ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් වැඩි හරියකට ඇය අත්සන් තබා තිබේ. යුක්ති සහගත කළ හැකි මානව හිමිකම් සහතික කිරීම් එහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් වී තිබේ. දීර්ඝ කාලයක් තිස්සේ පවතින ප්‍රජාතන්ත්‍රවාදී හා නෛතික සම්ප්‍රදායන් ඇය සතුය. දශකයකට වැඩි කාලයක් තිස්සේ පවතින ජාතික මානව හිමිකම් කොමිෂන් සභාවක් ද තිබේ. ක්‍රියාශීලි ජන මාධ්‍යයක් ද තිබෙන ශ්‍රී ලංකාව කැප වූ සිවිල් සමාජයක ප්‍රතිලාභ ද භුක්ති විඳී.

කෙසේ වුවද, සන්නද්ධ ගැටුම සහ ත්‍රස්තවාදයට එරෙහිව ගනු ලබන හදිසි අවස්ථා ක්‍රියාමාර්ග ඉදිරියේ නීතියේ ආධිපත්‍යයේ දුර්වලත්වය සහ දඬුවමින් බේරී සිටීම භයානක තත්ත්වයට පත් වෙමින් තිබේ. නොවිසඳුණු ඝාතනය කිරීම්, පැහැරගෙන යෑම් සහ අතුරුදහන්වීම් පිළිබඳ වාර්තා රාශියක් ලැබේ. නොවිසඳුණු අතුරුදහන්වීම් පිළිබඳ දීර්ඝ හා කම්පනය ඇති කරන අත්දැකීම් ඇති හා එවැනි උල්ලංඝනය වීම් සිදුවීම වැළැක්වීම සඳහා කටයුතු කළ යුත්තේ කෙසේ ද යන්න සම්බන්ධයෙන් අතීත පරීක්ෂණ කොමිෂන් සභාවල නිර්දේශවලින් අඩුවක් නැති රටක මෙය විශේෂයෙන් කනස්සල්ල ඇති කරන තත්ත්වයකි. මේ ගැටලු විසඳීම සඳහා ගෙන ඇති විවිධ ක්‍රියාමාර්ග රජය පෙන්වා දෙන අතර ම, මේ සිදුවීම් විශාල බහුතරය සම්බන්ධයෙන් ප්‍රමාණවත් සහ විශ්වසනීය ආකාරයේ රාජ්‍ය වගකීමක්, තවමත් ඇති වී නැත. වඩා ප්‍රබල විමර්ශන, නඩු පැවරීම් සහ වැරදිකරුවන් බවට පත් කිරීම් දක්නට නොලැබෙන තත්ත්වයක් තුළ මෙය කෙසේ අවසන් වනු ඇත්දැයි දැකීම දුෂ්කර වී තිබේ.

අවශ්‍ය මානව හිමිකම් පිළිබඳ ආයතනික යටිතල ව්‍යුහයන්ගෙන් වැඩි කොටසක් ම ශ්‍රී ලංකාව සතු වන අතර, ආරක්ෂාව පිළිබඳ තීරණාත්මක මූලිකාංග හානියට හෝ අන්තරායට පත්ව තිබේ. දේශීය නීතියට  ගිවිසුම් අදාළ කර ගැනීම සිංගරාසා නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රශ්න කරනු ලැබ ඇත. මේ ගැටලුවට විසඳුමක් වශයෙන් මේ සතියේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද රජයේ යෝජිත පනත් කෙටුම්පතින් ගැටලු සහ අවදානම් පිළිබඳ අර්ධ වශයෙන් පමණක් අවධානය යොමු වන අතර එමගින් ජාතික නීතියේ විවිධ අයිතිවාසිකම්වල තත්ත්වය තවදුරටත් ව්‍යාකූල වී තිබේ.

මගේ සියලු සාකච්ඡාවලදී ම රජයේ නියෝජිතයන් පුන පුනා ප්‍රකාශ කර සිටියේ මානව හිමිකම් ආරක්ෂාව සඳහා ජාතික යන්ත්‍රණයන් ප්‍රමාණවත් වන නමුත් ඒ සඳහා හැකියා වර්ධනය සහ ජාත්‍යන්තර ප්‍රජාවෙන් වැඩිදුර උපකාරය අවශ්‍ය වන බවය. ඊට වෙනස් ආකාරයෙන්, පුළුල් දේශපාලන පැතිකඩකින් සහ විවිධ ප්‍රජාවන්ගෙන් මා වෙත පළවුණු අදහස වූයේ වඩාත් ම බරපතළ මානව හිමිකම් අපයෝජනයන්ගෙන් ප්‍රමාණවත් පරිදි ආරක්ෂාවක් ලබා දීමට පවත්නා අදාළ ආයතන සතු හැකියාව පිළිබඳ ඔවුන්ට විශ්වාසයක් නැති බවය.

සමහර ආයතන මේ සම්බන්ධයෙන් තම සීමාවන් පිළිගත්තේය. තම ඉල්ලීම්වලට ප්‍රතිචාර වශයෙන් ඉදිරිපත් වීමට සමහර රාජ්‍ය නිලධාරීන් අසමත් වූ බව පරීක්ෂණ කොමිසමේ සාමාජිකයෝ මට පෙන්වා දුන්හ. සාක්ෂිකරුවන්ට  සහාය වීමේ සහ ඔවුන් ආරක්ෂා කිරීමේ

ඵලදායී ක්‍රමයක් නොමැති වීම ඔවුන්ගේ කටයුතුවලට ප්‍රධාන බාධාවක් වී ඇතැයි ද ඔවුහු ප්‍රකාශ කළහ. මගේ අදහස අනුව නම්, පොදුවේ මහජන අදහස් විමසීම්වලින් මහජන විශ්වාසය වැඩියෙන් ඇති කර ගැනීමට කොමිසමට හැකි වනු ඇත. කෙසේ වුවද, පරීක්ෂණ කොමිසම යනු විශේෂයෙන් ම කම්පනය ඇති කරන සිදුවීම් මාලාවකට අවස්ථානුකූල ප්‍රතිචාරයක් වන අතර එය අදාළ නීතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන ගන්නා ඵලදායී ක්‍රියාමාර්ගයට විකල්පයක් නොවිය යුතුය. එසේ ම ඉදිරිය බලන අංග සම්පූර්ණ හා ඵලදායී මානව හිමිකම් ආරක්ෂක පද්ධතියක අවශ්‍යතාවෙන් එය වෙනස් ව නොයා යුතුය.

අතීතයේ දී මානව හිමිකම් කොමිසම මේ සම්බන්ධයෙන් වැදගත් කාර්ය භාරයක් ඉටු කර තිබේ. කෙසේ වුවද, කොමසාරිස්වරුන් පත් කිරීම සම්බන්ධයෙන් වූ මතභේදය නිරාකරණය කර ගැනීමට අසමත් වීම නිසා, දේශීය වශයෙන් මෙන් ම අන්තර් ජාතික වශයෙන් ද මානව හිමිකම් කොමිසම පිළිබඳ විශ්වාසයේ අර්බුදයක් නිර්මාණය වී තිබේ. පොදු විමර්ශනයක් ක්‍රමානුකූලව පැවැත්වීමටත්, නිසි කලට පොදු වාර්තා නිකුත් කිරීමටත් මානව හිමිකම් කොමිසම අසමත් වීම නිසා, එහි ඵලදායීත්වය හා ස්වාධීනත්වය පිළිබඳ විශ්වාසයට තවදුරටත් හානි පැමිණ තිබේ. ඇත්ත වශයෙන් ම මේ ආයතන පාලනය කරන ජාත්‍යන්තර මණ්ඩලයට තමා සතු පිළිගැනීම ද කොමිසමට අහිමි විය හැකිය.

මගේ අදහස අනුව නම් ශ්‍රී ලංකාවේ වර්තමානයේ ඇති මානව හිමිකම් ආරක්ෂාව පිළිබඳ හිඩැස තනිකර ම හැකියාව පිළිබඳ ප්‍රශ්නයක් නොවේ. විශේෂිත ක්ෂේත්‍ර තුළ පුහුණුව හා අන්තර්ජාතික විශේෂඥතාව අවශ්‍ය වන අතර – එය රජය කැමැත්තෙන් පිළිගනු ඇති බව මට පැහැදිලිය – ශ්‍රී ලංකාවේ මූලික මානව හිමිකම් අඩුපාඩුවලින් එකක් වන්නේ මානව හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳ විශ්වාස කළ හැකි සහ සාක්ෂි සහිත චෝදනා නොමැතිවීමය යන්න මට විශ්වාසය.

ප්‍රචාරක වාසිය සඳහා තමන්ට ඕනෑ පරිදි තොරතුරු හැසිරවීමට එල්.ටී.ටී.ඊ. සංවිධානය කඩිනමින් කටයුතු කරතැයි බොහෝ දෙනා ප්‍රකාශ කරති. මගේ අදහස අනුව නම් ඉන් සිදුවන්නේ ස්වාධීන තොරතුරු රැස් කිරීම සහ මානව හිමිකම් ගැටලු පිළිබඳ පොදු වාර්තාකරණය සඳහා වන අවශ්‍යතාව වඩා ප්‍රබල වීමය.

මේ ආකාරයෙන් ශ්‍රී ලංකා රජයට උපකාර කිරීමට OHCHR කැමැත්තෙන් සිටී. මානව හිමිකම් ආරක්ෂා කිරීමේ ලා අන්තර්ජාතික උපකාරයේ අවශ්‍යතාව පිළිබඳව සජීවී ජාතික විවාදයක් පවතින බව මම දනිමි. වාර්තා වන පරිදි, පවත්නා උල්ලංඝනයවීම්වල බරපතළකම සහ විශේෂයෙන් ම ජීවිතවලට හා පුද්ගල ආරක්ෂාවට එල්ල වී ඇති තර්ජන සලකන කල, OHCHR සහ ශ්‍රී ලංකා රජය අතර ඵලදායී සම්බන්ධතාවක අනාගතය පිළිබඳව සිදුවෙමින් පවත්නා සාකච්ඡා අප නොපමාව නිරාකරණය කර ගත යුතු යැයි මම විශ්වාස කරමි.

අවසන් වශයෙන් තවත් එක් කරුණක් සඳහන් කරනු කැමැත්තෙමි. එනම්; බලහත්කාරයෙන් කරනු ලබන අතුරුදහන් කිරීම්වලින් සියලු පුද්ගලයන් ආරක්ෂා කිරීම පිළිබඳ නව අන්තර්ජාතික

සම්මුතියට රජය නොපමාව පාර්ශවකරුවකු බවට පත් වීම බෙහෙවින් ම සුදුසු බවය. අන්තර්ජාතික මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම පිළිබඳ වාර්තා වී ඇති කරුණු සලකා බැලීමේදී, අන්තර්ජාතික අපරාධ අධිකරණය ස්ථාපනය කළ රෝම ගිවිසුම අනුමත කර ඇති රටවල් 105 ට එකතු වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව දැඩි ලෙස සලකා බැලිය යුතුව තිබේ.